සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

**6 ශ්‍රේණිය** | **භූගෝල විද්‍යාව** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

## I - කොටස

**සැලකිය යුතුයි**

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ශ්‍රී ලංකාවේ විශාලම පළාත කුමක් ද?
    (1) දකුණු පළාත (2) වයඹ පළාත
    (3) උතුරු මැද පළාත (4) ඌව පළාත

02. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු මූලස්ථානය පිහිටා ඇත්තේ,
    (1) කොළඹ (2) ගාල්ල
    (3) මහනුවර (4) ත්‍රිකුණාමලය

03. වර්ෂාපතනය මනිනු ලබන්නේ,
    (1) මිලි මීටර් වලිනි. (2) මිලි ලීටර් වලිනි.
    (3) ලීටර් වලිනි. (4) මීටර් වලිනි.

04. උතුරු සහ නැගෙනහිර දිශාව අතර පිහිටා ඇත්තේ,
    (1) ගිණිකොණ දිශාවය. (2) ඊසාන දිශාවය.
    (3) වයඹ දිශාවය. (4) නිරිත දිශාවය.

05. සුළගේ වේගය මැනීමට භාවිත කරන උපකරණය වන්නේ,
    (1) උෂ්ණත්ව මානයයි. (2) වර්ෂා මානයයි.
    (3) සුළං දිශා දර්ශකයයි. (4) අනිල මානයයි.

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා 'අ' සහ 'ආ' තීරු දෙක නිවැරදිව ගලපා යා කරන්න.**

| 'අ' | 'ආ' |
|---|---|
| 06. වවුලා | A - කුඹුරුවලට හානි කරන කෘමීන් විනාශ කිරීම. |
| 07. කපුටා | B - ගස් වල බීජ ව්‍යාප්තියට සහය වීම. |
| 08. ගිරවා | C - අපද්‍රව්‍ය කැබලිකර දිරාපත් කිරීමට උදව් කිරීම. |
| 09. බත්කූරා | D - කුණු කසල කා දැමීම. |
| 10. වේයා | E - පරිසරයට සෞන්දර්යක් එක් කිරීම. |

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට අදාල පිළිතර වරහන් තුළින් තෝරා ලියන්න.**

11. ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ ............................................................ වගාව බහුලව සිදුකරයි.

12. ශ්‍රී ලංකාවේ තේ වගාව .......................................................................................... යේ සිදුකරයි.

13. පිළිමතලාවේ නිපදවන .................................................................. නිවාස අලංකරණය සඳහා යොදා ගනියි.

14. මුස්ලිම් ජනයා ............................................................................................ ආගම අදහනු ලබයි.

15. අව්ච්චියා යනු ...................................................................................................... පක්ෂියෙකි.

(පිත්තල භාණ්ඩ / සංචාරක / කඳුකර කලාප / ඉස්ලාම් / දුම්කොල)

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රකාශන නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද දී ඇති වරහන් තුළ යොදන්න.**

16. ඉන්ධන ලබාදීම ශාකවලින් ලැබෙන ප්‍රයෝජනයක් වේ. (.........)

17. කාලගුණික තොරතුරු ධීවරයින්ට වැදගත් නොවේ. (.........)

18. රත්නපුර දිස්ත්‍රික්කය ඌව පළාතට අයත් වේ. (.........)

19. නයා විෂ සහිත සර්පයෙකි. (.........)

20. අම්බලන්ගොඩ පැදුරු සඳහා ප්‍රසිද්ධ වී ඇත. (.........)

(2 x 20 = ල. 40)

## II - කොටස

සැලකිය යුතුයි

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**


01. (i) ඉහත දැක්වෙන පරිපාලන කොට්ඨාස ධූරාවලියේ අංක 2, 3 සහ 5 නිවැරදිව නම් කරන්න. (ල. 03)

(ii) ඔබ පාසල පිහිටි දිස්ත්‍රික්කය කුමක් ද? (ල. 02)

(iii) ඔබ පාසල අවට පිහිටි පොදු ස්ථාන 03 ක් නම් කරන්න. (ල. 03)

(iv) ඔබ පාසල පිහිටි දිස්ත්‍රික්කයට මායිම්වන වෙනත් දිස්ත්‍රික්ක 02 ක් ලියන්න. (ල. 02)

(v) සබරගමුව පළාතට අයත් දිස්ත්‍රික්ක 02 ක කුමක් ද? (ල. 02)



02. (i) කාලගුණික අංග 02 ක් නම් කරන්න. (ල. 02)

(ii) කාලගුණික අංග 04 ක් සහ ඒවා මනින උපකරණ දක්වෙන පහත වගු සටහන සම්පූර්ණ කරන්න. (ල. 04)

| කාලගුණික අංග | මනින උපකරණය |
|---|---|
| 1. ............................................. | ............................................. |
| 2. ............................................. | ............................................. |
| 3. ............................................. | ............................................. |
| 4. ............................................. | ............................................. |

(iii) (a) කාලගුණික තොරතුරු දැනගැනීමෙන් පුද්ගලයාට වන වාසි 03 ක් ලියන්න. (ල. 03)

(b) ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

03. (i) ප්‍රධාන දිශා 4 න් තුනක් නම් කරන්න. (ල. 03)

(ii) පාසල් භූමියක ඇති ප්‍රධාන ගොඩනැගිලි 04 ක් සඳහන් කරන්න. (ල. 04)

(iii) (a) පාසලක දළ සැලැස්මක ඇති ප්‍රයෝජන 02 ක් නම් කරන්න. (ල. 02)

(b) මාලිමා යන්ත්‍රයක් නොමැතිව දිශාව හඳුනා ගන්නා ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

04. (i) සංචාරක පක්ෂීන් තිදෙනෙක් නම් කරන්න. (ල. 03)

(ii) ශාක වලින් අපට ලැබෙන ප්‍රයෝජන 04 ක් ලියා දක්වන්න. (ල. 04)

(iii) (a) පහත සඳහන් කාණ්ඩ වලට අදාල සතුන් 01 බැගින් නම් කරන්න. (ල. 03)

1) විෂ සහිත උරගයින් - ............................................................

2) රාත්‍රියේ හැසිරෙන සතුන් - ............................................................

3) ලෙඩරෝග බෝ කරන සතුන් - ............................................................

(b) සතුන්ගෙන් මිනිසාට ඇති ප්‍රයෝජන කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

05. (i) ශ්‍රී ලංකාවේ ජීවත්වන ජන වර්ග 03 ක් නම් කරන්න. (ල. 03)

(ii) ලංකාවේ ජීවත්වන ප්‍රජාව අදහන ආගම් 04 ක් නම් කරන්න. (ල. 04)

(iii) (a) පහත වගුව සම්පූර්ණ කරන්න. (ල. 03)

| ආගම | උත්සව |
|---|---|
| 1. ..................................................... | ..................................................... |
| 2. ..................................................... | ..................................................... |
| 3. ..................................................... | ..................................................... |

(b) විවිධ ජාතික හා ආගමික උත්සව වලදී ඔබ අසල්වාසීන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

06. (i) සත්ව පාලනය යටතේ ඇතිකරන සත්වයින් තිදෙනෙක් නම් කරන්න. (ල. 03)

(ii) පාරම්පරික ශිල්ප ඥානය මත පදනම් වූ කර්මාන්ත 04 ක් නම් කරන්න. (ල. 04)

(iii) (a) ප්‍රදේශයක දක්නට ලැබෙන සේවා 03 ක් ලියා දක්වන්න. (ල. 03)

(b) එම සේවා මඟින් ලැබෙන ප්‍රයෝජන පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

| 6 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය 2025 | භූගෝල විද්‍යාව |
|---|---|---|

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 06. | B | 11. | දුම්කොල | 16. | ✓ |
| 02. | 1 | 07. | D | 12. | කඳුකර කලාප | 17. | × |
| 03. | 1 | 08. | E | 13. | පිත්තල භාණ්ඩ | 18. | × |
| 04. | 2 | 09. | A | 14. | ඉස්ලාම් | 19. | ✓ |
| 05. | 4 | 10. | C | 15. | සංචාරක | 20. | × |

(2 x 20 = ල. 40)

## II කොටස

01. (i) ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, පළාත (ල.03)
(ii) කුරුණෑගල (ල.02)
(iii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තැපැල් කාර්යාලය, පොලීසිය, ප්‍රාදේශීය සභාව, රෝහල, බැංකුව (ල.03)
(iv) පුත්තල, මහනුවර, ගම්පහ, කෑගල්ල, මාතලේ, අනුරාධපුර (ල.02)
(v) රත්නපුර, කෑගල්ල (ල.02)

02. (i) උෂ්ණත්වය, වර්ෂාපතනය, සුළං, වලාකුළු (ල.02)
(ii) උෂ්ණත්වය - උෂ්ණත්වමානය
වර්ෂාපතනය - වර්ෂාමානය
සුළඟේ වේගය - අනිලමානය
සුළං හමන දිශාව - සුළං දිශා දර්ශකය (ල.02)
(iii) (a) එදිනෙදා කටයුතු මනාව සංවිධානය / ධීවර සහ ගොවි ජනතාව වැදගත් වීම. / ආපදා සිදුවන ප්‍රදේශ දැනගත හැකි වීම. (ල.03)
(b) විස්තරයට අනුව ලකුණු ලබා දෙන්න. (ල.03)

03. (i) උතුර, දකුණ, නැගෙනහිර, බටහිර (ල.03)
(ii) කාර්යාලය, විද්‍යාගාරය, ක්‍රීඩාගාරය, පුස්තකාලය, ගෘහ විද්‍යාගාරය, ආපනශාලාව, බුදු මැදුර (ආදී ලෙස) (ල.04)
(iii) (a) පරිපාලන කටයුතු පහසුවීම. / පිටතින් පැමිණෙන අයට පාසල තුළ පිහිටීම් දැනගත හැකි වීම / පිරිසිදු කිරීමේ කටයුතු විධිමත් කල හැකි වීම / දරුවන්ට පාසල පිළිබඳ අවබෝධයක් ලැබීම. (ල.02)
(b) හිරු උදාවන දිශාවට මුහුණලා දෑත් දෙපසට කර හිට ගැනීම (එයට අදාල විස්තරය) (ල.03)

04. (i) සිවුරු හොරා / සුදු රෙදි හොරා / අවිච්චියා (ල.03)
(ii) වායුගෝලය පිරිසිදු කිරීම, ස්වාභාවික සෞන්දර්ය, ආහාර සහ වනවගා, සතුන්ට නිවාස, සෙවන, සිසිලස, ඉන්ධන ලබා ගැනීම ආදී, (ල.04)
(iii) (a) 1) නයා, පොළඟා 2) වවුලා, බස්සා, බකමූණා 3) මීයා, මදුරුවා, මැස්සා (ල.03)
(b) පරාගනය, අපද්‍රව්‍ය දිරාපත් කිරීම, පරිසර අලංකරණය, කූණු කා දැමීම, බීජ ව්‍යාප්තිය, වගාවට හානිකරන සතුන් විනාශ කිරීම (ආදී වශයෙන්) (ල.02)

05. (i) සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, ජා, මැලේ (ල.03)
(ii) බුදුදහම, ක්‍රිස්තියානි ආගම, හින්දු ආගම, මුස්ලිම් ආගම (ල.04)
(iii) (a) (ල.03)

| ආගම | උත්සව |
|---|---|
| බෞද්ධ | වෙසක්, පොසොන් |
| හින්දු | දීපවාලී, තෛපොංගල් |
| මුස්ලිම් | රාමසාන්, හජ්ජි |
| ක්‍රිස්තියානි | නත්තල්, පාස්කු |

(b) සමගිය, සහයෝගය පිළිබඳ කියැවෙන විස්තරයට අනුව ලකුණු ලබා දෙන්න. (ල.02)

06. (i) ගවයා, එළුවා, කුකුලා, ඌරා (ල.03)
(ii) ලී බඩු, වෙස් මුහුණු, පිත්තල භාණ්ඩ, වේවැල්, පැදුරු (ල.04)
(iii) (a) සෞඛ්‍ය, අධ්‍යාපන, ප්‍රවාහන, තැපැල්, බැංකු, ........ (ල.03)
(b) ඔසුසැල් වලින් ඖෂධ, වාර ප්‍රවේශ පත්‍ර, නිදහස් අධ්‍යාපනය සහ සෞඛ්‍යය (ආදී ලෙස) (ල.02)